# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/39 - 2016 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

212 වැනි වගන්තිය යටතේ සාදන ලද නියෝගය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 104 වගන්තියේ (3), (3අ) සහ 4 වැනි උපවගන්ති සහ 104 අ වගන්තියේ (3) සහ (4) වැනි උප වගන්ති සමග කියවිය යුතු, එකී දේශීය ආදායම් පනතේ 212 වැනි වගන්තිය යටතේ, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද, එම පනතේ 104 වැනි වගන්තියේ (3) සහ (4) වැනි උපවගන්ති සමග කියවිය යුතු, 2013 අගෝස්තු මස 12 වැනි දින හා අංක 1823/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ 1 කොටස මගින් ප්‍රකාශයට පත්කරන ලද නියෝගයන් හි 9 සහ 10 වැනි නියෝග ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් 2015 අප්‍රේල් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සංශෝධන කරනු ලැබේ.

(1) 9 වැනි නියෝගය ඉවත් කිරීම සහ ඒ වෙනුවට පහත සඳහන් නියෝගය ආදේශ කිරීම.

"9. අධ්‍යක්ෂවරයා/ප්‍රධාන නිලධාරියා/ප්‍රමුඛ හවුල්කරු විසින් සිදු කළ යුතු හෙළිදරව් කිරීම්.

ගිණුම් ප්‍රකාශනයන්හි වාර්තා ගත කොට ඇති පරිදි යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලු ආශ්‍රිත ව්‍යවසායන් සමග ගනුදෙනු හෝ ගනුදෙනු ප්‍රභේදයන්ගේ මුළු එකතු අගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි සෑම ආශ්‍රිත ව්‍යවසායක්ම, ආදායම් බදු වාර්තාව සමඟ පහත වාර්තාවන් ඉදිරිපත් කළ යුතු ය.

පැවරුම් මිල සම්බන්ධ පහත සඳහන් හෙළිදරව් කිරීම් ඉහත වාර්තාවන්හි අන්තර්ගත විය යුතු ය;

(අ) දේශීය ආදායම් පනතේ 107(2)(අ) වගන්තිය යටතේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, ආශ්‍රිත ව්‍යවසායන් සමඟ එළඹි ගනුදෙනුව/ගනුදෙනු හෝ ගනුදෙනු ප්‍රභේදයන්ගේ වාර්තාවක්;

(ආ) පැවරුම් මිල නිශ්චය කිරීම කෙරෙහි බලපාන ක්‍රමෝපායන් හා ප්‍රතිපත්තීන් විස්තර කෙරෙන පැවරුම් මිල ප්‍රතිපත්ති ප්‍රකාශයක්;

(ඇ) ඇතිවිය හැකි යම් අවධානම් සාධකයන් (තිබේනම්), ඒ පිළිබඳව කළමනාකරන ප්‍රත්‍යක්ෂයන්;

(ඈ) ආශ්‍රිත ව්‍යවසායයන්ට අදාළ, හිඟ අයිතමයන්ගේ මුදල හෝ උචිත සමානුපාතිකයන්, සහ ශේෂ පත්‍ර දිනට එබඳු ආශ්‍රිත ව්‍යවසායන්ගෙන් ලැබිය යුතු අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන;


1A - PG 2923 — 157 (2016/03)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන හෝ යම් වෙනත් නීතියක් යටතේ හෝ ගිණුම් ප්‍රමිත යටතේ හෙළිදරව් කළ යුතු බවට නියම කෙරෙන ආශ්‍රිත ව්‍යවසායයන් සමඟ එළඹි ගනුදෙනුවලට අදාළ වෙනත් ප්‍රමාණවත් තොරතුරු.

එසේ වුවද, ඉහත ආශ්‍රිත ව්‍යවසාය, යම් ආශ්‍රිත ව්‍යවසායක් සමග එළඹෙන ලද මුළු ගනුදෙනුව/ගනුදෙනු හෝ ගනුදෙනු ප්‍රභේදයන්ගේ එකතුව, ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 හෝ ඊට අඩු ගනුදෙනුවක්/ගනුදෙනු සිදුකරනු ලබන යම් ආශ්‍රිත ව්‍යවසායක් සම්බන්ධයෙන් ඉහත හෙළිදරව් කිරීම (අ) ඡේදයට සීමා කළ හැක.”

(2) 10 වැනි නියෝගය ඉවත් කිරීම සහ ඒ වෙනුවට පහත සඳහන් නියෝගය ආදේශ කිරීම.

‘‘10 පැවරුම් මිල සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ / ප්‍රධාන නිලධාරියාගේ/ප්‍රමුඛ හවුල්කරුගේ සහතිකය.

(අ) ගිණුම් ප්‍රකාශනයන්හි වාර්තා ගත කොට ඇති පරිදි යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලු ආශ්‍රිත ව්‍යවසායයන් සමඟ කරනු ලබන ගනුදෙනු හෝ ගනුදෙනු ප්‍රභේදයන්ගේ මුළු එකතු අගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි වන සෑම ආශ්‍රිත ව්‍යවසායකම අධ්‍යක්ෂ/ප්‍රධාන නිලධාරියා/ප්‍රමුඛ හවුල්කරු විසින්, වාර්ෂික ආදායම් බදු වාර්තාව සමග පැවරුම් මිල සම්බන්ධයෙන් සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එම සහතිකයේ පිටපත් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වෙත ලබා දිය යුතු ය. සමාගමක් සම්බන්ධයෙන් වන අවසථාවකදී අදාළ සහතිකය, වාර්ෂික වාර්තාවේ ඇතුලත් කිරීම හෝ පිටපත් කොටස් හිමියන් වෙත ලබා දීම අවශ්‍ය වේ.

(ඇ) අධ්‍යක්ෂවරයාගේ/ප්‍රධාන නිලධාරියාගේ/ප්‍රමුඛ හවුල්කරුගේ සහතිකය පහත සඳහන් ආකෘති පත්‍රය අනුව විය යුතු ය.

**පැවරුම් මිල සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ/ප්‍රධාන නිලධාරියාගේ/ප්‍රමුඛ හවුල්කරුගේ සහතිකය**

සමාගම/හවුල් ව්‍යාපාරය, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 104 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද පැවරුම් මිල නියෝග වලට අනුකූලව කටයුතු කර ඇති බව සහතික කෙරේ. මෙම නියෝග ප්‍රකාර තොරතුරු, එකී දේශීය ආදායම් පනතේ 107(2)(අ) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අනුමත ගණකාධිකාරිවරයාගේ සහතිකය යටතේ දක්වා ඇත. ................. සිට ..................... දක්වා වූ කාලපරිච්ඡේදය තුළ, ආශ්‍රිත ව්‍යවසාය/ව්‍යවසායයන් සමග එළඹෙන ලද ගනුදෙනුව/ගනුදෙනු අසම්බන්ධිත මෙන්ම එය සමාගමේ/හවුල් ව්‍යාපාරයේ අභිවෘද්ධියට අනර්ථකාරී නොවන බවටත්, ලාභ මාරුකිරීමේ කාර්යයන් සඳහා පවත්වාගෙන ගොස් නැති බවටත් මම / අපි විශ්වාස කරමි / කරමු.

සියලු ගනුදෙනුවලට අදාළ වාර්තා සහ තොරතුරු පැවරුම් මිල විමර්ෂණය සිදු කරනු ලබන, අනුමත ගණකාධිකාරීවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර අනුමත ගණකාධිවරයාගේ සහතිකයේ [කිසිදු අහිතකර මත ප්‍රකාශයක් කර නොමැත] / [අහිතකර මත ප්‍රකාශයක් කර ඇත] *

..................... අධ්‍යක්ෂ මණ්ඩලය/ප්‍රධාන නිලධාරියා/ප්‍රමුඛ හවුල්කරු
ස්ථානය වෙනුවට/වෙනුවෙන්.

* අදාළ නොවන වචන කපා හරින්න’’.

සටහන : යම් ආශ්‍රිත ව්‍යවසායක් සමග එළඹෙන ලද මුළු ගණුදෙනුවල එකතුව ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 හෝ ඊට අඩු ගනුදෙනුවක්/ගනුදෙනු සිදුකරනු ලබන යම් සමාගමක්/හවුල් ව්‍යාපාරයක්, අදාළ ගනුදෙනුව/ගනුදෙනුවලට අදාළ වාර්තා සහ තොරතුරු අනුමත ගණකාධිකාරීවරයා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.

05 - 29

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.